<u>'පට්ඨාන' ධර්ම දේශනා මාලාව - වීරිවාර</u>
<u>අත්ථි - නත්ථි - විගත - අවිගත ප්‍රත්‍යය</u>
<u>23.01.2020</u>

නමො තසස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරිහත් වූ සර්වඥ සම්මා සම්බුදුපියාණන් වහන්සේට ස්වකීය උත්සාහයෙන් ඥානය උපදවාගෙන සිහිය අවධිකරගෙන තමන් වහන්සේගේ සන්තානයේ පැවතියා වූ ක්ලේශ ධර්මයන් මනසිකාර වශයෙන් ඉවත් කරලා සිහිය පිහිටුවාගෙන නුවණින් දැක කෙලෙසුන් කෙරෙන් දුරු උනා වූ මාර්ග ධර්මයන්ට පත් වීමෙන් කෙලෙස් සතුරන් නැසුවා වූ සංසාරයේ ඉපදීම් වශයෙන් යන්නා වූ භව චක්‍රයේ අර සිඳලූවා වූ ඒ නිසාම දෙවියන්ට මනුස්සයන්ට පූජණීය ධර්ම වස්තුවක් උනා වූ කිසිම අවස්ථාවක රහසින් වත් පාප සිතුවිල්ලක් ඇති කර නොගත්තා වූ එයට කිසිම අවකාශයක් සන්තානයේ නැත්තා වූ පිරිසිදු වූ නිර්මල වූ විමල වූ සන්තානයක් ඇති ලෝකයට ධර්මය මතුකොට පහදා වදාළා වූ සත්වයන් කෙරෙහි පතල මහා කරුණා ගුණයක් ධරන්නා වූ තථාගත සම්මා සම්බුදුපියාණන් වහන්සේට මම මේ අවස්ථාවේදී සිරසින් වැඳ නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා!

ලොව්තුරා සම්මා සම්බුදුපියාණන් වහන්සේගේ උතුම් වූ සර්වඥතාඥානයෙන් දැක අවබෝධකොටගෙන පිරිසිදුව පැහැදිලිව දේශනාකොට වදාළා වූ නෛර්යාණික වූ පුථුජ්ජන සත්වයන් නිමල වූ අසංඛත ධාතු සංඛ්‍යාත නිර්වාණයට පමුණුවන්නා වූ යොමු කරන්නා වූ නිර්වාණ ධාතුවත් මිශ්‍ර උනා වූ ඒ උතුම් වූ ධර්ම රත්නයට මම නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා!

තථාගතයන් වහන්සේගේ අනුසාසනාවේ ශ්‍රද්ධාවෙන් පිහිටා ජීවිත කැප කිරීමෙන් කෙලෙසුන්ගෙන් මිදී ආර්ය තත්වයට පත් උනා වූ අෂ්ඨාර්ය පුද්ගල මහා සංඝ රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා!

අනන්ත අපරිමාණ බුදුගුණ බලයෙන් දහම් ගුණ බලයෙන් සඝ ගුණ බලයෙන් තුනුරුවන් ගුණ මෙනෙහිකොට වන්දනා කිරිමේ කුසල චේතනාවන්ගේ ආනුභාව බලයෙන් සහ මේ පින්වත් අසාගෙන සිටින සියලු දෙනාම මේ අවස්ථාව වෙනකොට දාන සීල භාවනා වශයෙන් සීල සමාධි ප්‍රඥා වශයෙන් උපදවාගෙන තිබෙන කුසල ධර්මයන්ගේ බලයත් ආනිසංස වශයෙන් මෙතැනට ඉදිරිපත් වෙලා අදත් මේ දවසේ අපි මේ සාකච්ඡා කරන්න කථා කරන්න කියා දෙන්න යන පට්ඨාන දේශනාවට අයිති ධර්ම කාණ්ඩය සැම දෙනාටම හොඳින් වටහා ගන්න හැකි වේවා! තේරුම් ගන්න හැකිවේවා! සියලු දෙනාටම මෙය භාවනා මනසිකාරයක් වේවා! නොඅසපු නොදැකපු නොකියවපු ධර්ම කොට්ඨාසයක් අසාගෙන හිතාගෙන ඒ තුල තිබෙන ධර්ම රසය මතුකරගෙන ඒවගේම මනසිකාරය පවත්වාගෙන එය ප්‍රතිපදාවක් කරගෙන සසර දුකින් මිදී නිවනින් සැනසෙන්න ලැබේවා කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා, ආශිර්වාද කරනවා.

එසේ කරුණාවෙන් ප්‍රාර්ථනා කරන ගමන් මේ පින්වතුන්ට අදට අපි කියලා දෙන්න හිතාගෙන සිටින ඒවගේම මීට පෙර දේශනා කරන ලද ධර්ම කාණ්ඩයකට සම්බන්ධ කරලා මේ කොටස ඉදිරිපත් කරනවා. ගිය සතියේ අපි කථා කළා අත්ථි ප්‍රත්‍යය - නත්ථි ප්‍රත්‍යය - විගත ප්‍රත්‍යය සහ අවිගත ප්‍රත්‍යය කියන ප්‍රත්‍යය ධර්මයන් අවසානයට මේ සුවිසි ප්‍රත්‍යය ධර්මයන් තුල තිබෙනවාය කියලා. මේ ප්‍රත්‍යය කථාව හරිම ගැඹුරුයි. හොඳ නුවණක් මනසිකාරයක්, මෙහෙමත් දෙයක් තිබෙනවාද කියන ප්‍රශ්නය

හිතට ගොඩ නංවාගෙන ඇතිකරගෙන මේක දිහා බැලුවොත් පමණයි මෙහි තිබෙන්නා වූ ධර්මය මතුකරලා ගන්න පුළුවන්කම තිබෙන්නේ.

එතකොට මේ දක්වා ප්‍රත්‍යය ධර්ම 20 ගැන කියලා තිබෙනවා. එතකොට ගිය සතියේ අපි 21 සහ 22 පටන්ගත්තා. අත්ථි ප්‍රත්‍යය නත්ථි ප්‍රත්‍යය විගත සහ අවිගත කියන ප්‍රත්‍යය ධර්මයෝ මුහුණුවරින් ටිකක් එක ළඟින් යන්නේ. එකසමාන ස්වභාවයක් ඕවට තිබෙන්නේ. ගිය සතියේ අපි මතක් කළා මේ පින්වතුන්ට අත්ථි ප්‍රත්‍යය කියන්නේ මොකක්ද කියලා. අපි වීථි වාර දෙක තුනකුත් කථා කළා. අත්ථි ප්‍රත්‍යයේ සහ නත්ථි ප්‍රත්‍යයේ තේරුම පොඩ්ඩක් හිතේ තවර ගත්තොත් අපිට පුළුවන් මේකේ ඉස්සරහට පහසුවෙන් යන්න. මෙහි නාම ධර්ම ගැන තමයි වැඩි පුර කථා කරන්නේ. රූප ධර්ම ගැනත් අපි කථා කරනවා. නාම රූප ධර්මයන්ගේ සියුම් තැන් මේ.

සංස්කාරයෝ ඇතිවෙනවා නැතිවෙනවා කියලා කියනවා. ඒක එක චිත්තක්ෂණයයි. ඇතිවෙනවා නැතිවෙනවා. අපි මුලින්ම මේකට බහිනකොට කිව්වා ධර්ම කොට්ඨාස 4 ක් තිබෙනවා කියලා. ඒ තමයි චිත්ත ධර්ම කොට්ඨාසය - චෛතසික ධර්ම කොට්ඨාසය - රූප ධර්ම කොට්ඨාසය සහ නිර්වාණ ධර්මය. මේ ගොඩවල් හතරෙන් හේතු ඵලයන්ගෙන් ඇතිවෙන කථාව ඉදිරිපත් වෙන්නේ චිත්ත චෛතසික රූප ධර්ම වලට පමණයි. ඉතින් මේවා ඇතිවෙනවා නැතිවෙනවා. නමුත් මේවා ඇතිවෙලා චිත්තක්ෂණයයි තිබෙන්නේ. නාම ධර්ම උනත් චිත්තක්ෂණයයි. රූප ධර්ම වලට යනකොට සමහර ඒවා තිබෙනවා චිත්තක්ෂණ 17ක් විතර, ඒ විස්තරේ හැටියට. මේ නාම ධර්ම එක චිත්තක්ෂණයක හටගෙන උත්පාද - ඨිති - භංගය කියන අවස්ථාවන්ට පත්වෙනවා, භංගය නැතිවෙලා යනවා. ආයිමත් උත්පාද - ඨිති - භංග කියන අවස්ථාවට එනවා, නැවතත් භංගයෙන් නැතිවෙලා යනවා. ආයිමත් උත්පාද - ඨිති - භංග වශයෙන් මේක ඇතිවෙලා පැවතිලා නැතිවෙලා යනවා. ඔය වාගේ හැඩ රුවක් ඇති ඔය වාගේ ජීවන ස්වභාවයක් ඇති ඔය වාගේ පැවතීමක් ඇති ධර්ම වල තිබෙන්නා වූ හයිය ගැන කියන්න ගියොත් පෘථක්ජන ස්වභාවයේ ඉන්න පින්වතුන් කොහොමද මේක දැන ගන්නේ, ඇතිවෙලා යම්කිසි දෙයකට ප්‍රත්‍යය වෙනවා කියලා?

මේ අත්ථි ප්‍රත්‍යය කියන කථාවේදී චිත්ත චෛතසික නාම ධර්මයෝ හට ගත්තහම, චිත්තක්ෂණයකට ආවහම ඒ චිත්තක්ෂණයේ උත්පාද - ඨිති - භංග කියන ඔය පුංචි අවස්ථා තුනට අයිති කාලයේ තවත් එකකට උදව් කරනවා කියලා කිව්වට පස්සේ ඒවාට එහෙම හයියක් තිබෙනවද, අනිත් ඒවාට ඒ උදව්ව ගන්න හයියක් තිබෙනවාද කියලත් හිතෙනවා. අත්ථි ප්‍රත්‍යය ධර්ම කියලා කියන්නේ උපකාර කිරීමට ශක්තිය තිබෙන ධර්ම. ඒ ප්‍රත්‍යය ධර්මය අස්සේ තිබෙන ඒ උදව් වීගෙන යන, උදව් කරන ඒ ශක්ති බලයට කියනවා ප්‍රත්‍යය ශක්තිය කියලා. යම්කිසි ප්‍රත්‍යය ධර්මයක් තිබෙනවා නම් ඒකට ප්‍රත්‍යය ශක්තියක් තිබෙනවා. ඒ ප්‍රත්‍යය ශක්තිය තිබෙන නිසා තමයි අනිත් එකකට උදව් කරන්න පුළුවන් කමක් තිබෙන්නේ. මේ අත්ථි ප්‍රත්‍යය කථාවට ගියහම තිබෙන්නේ මේ පොඩි වෙලාවකට මතුවෙලා එන එක අනිත් එකකට උදව් කරලා මහා බලයක් ඇති කරලා යනවා. ඒක මම කොහොම කියන්නද මේ පින්වතුන්ට. මෙන්න මෙහෙම එකක් කියන්න පුළුවන් මේ පින්වතුන්ට මේක තේරුම් ගන්න.

මේක මේ අත්ථි ප්‍රත්‍යයේ තිබෙන හැඩ රුව. පහුගිය කාලේ ශ්‍රී ලංකාවේ තිබුණා යුද්ධයක්. ඒ යුද්ධ කාලයේදී අපි අහලා තිබෙනවා රාත්‍රියට යුධ පිටියේ පැරා ගහනවා කියලා එකක් කරලා තිබෙනවා. පැරා ගහනවා කියලා කියන්නේ උඩට ලයිට් එකක් විදිනවා. ඒක විද්දට පස්සේ උඩ ගිහිල්ලා මුළු පළාතම එළිය කරනවා. ඔහොම එළිය කරපු ගමන්ම ඒ එළියෙන් තමයි සතුරා ඉන්න තැන, ඒ පැත්ත අඳුර ගන්නේ. එහෙම අඳුරගෙන සතුරන් නසන්නේ ඒකෙන්. බලන්න එතකොට ඒ ලයිට් එක පත්තුවෙලා නිවිලා යන්න කලින් මොකක් හරි දෙයක් කළා. මේ උපමාව හැබැයි ටිකක් ඕලාරිකයි. ඕලාරිකයි කියලා කියන්නේ ඔය පැරා එක ගැහුවට පස්සේ ගොඩක් වෙලා මල් වෙඩිල්ල වගේ තිබෙනවා. ඉතින් ඒක හින්ද ගොඩක් වැඩ කරන්න පුළුවන්. සමහර වෙලාවට ඇලකින් දොළකින් පැනගෙන යන්නත් පුළුවන් ඒ ආලෝකය තිබෙන කාලය තුළ. මේ උපමාව මේක තේරුම් කරන්න කිව්වට ඒකෙ තිබෙනවා ඕලාරික ගතියක්.

යම් කිසි චිත්ත චෛතසික කාණ්ඩයක් ඉදිරිපත් උනහම ඒවා අනිත් එකකට උදව් වෙන විදියයි මේ කියන්නේ. තවත් සියුම්ව මේ ගැන හිතුවහම මට මේ වගේ අදහසක් එනවා. අපි කැමරාවකින් ෆොටෝ ගහන කොට සමහර වෙලාවට සමහ අය flash එකක් හයි කරනවා. ඒ flash එක ගහලා ෆොටෝ ගන්නවා. එතකොට පින්තූරේ ගන්න button එක ඔබන කොටම තමයි flash එක පත්තු වෙන්නේ. ඒ දෙකම එකට තමයි තිබෙන්නේ. එතකොට flash එක පත්තුවෙනවා light එකක් යනවා, ඒ එක්කම ඒ වෙලාවේදීම ෆොටෝ එකත් ගන්නවා. දැන් බලන්න මේ flash එක ඒ පිංතූරය ගන්න ඒ වෙලාවට උදව් කරනවා, flash එක ඇතිඋනා නැතිවෙලා ගියා. එතකොට ඒ ඇති උනා වූ ආලෝකයෙන් ඒ flash light එක තිබෙන පොඩි වෙලාවෙ තමයි ඒ පිංතූරය අල්ල ගන්නේ. ඔන්න ඔය වගේ ධර්මයක් තමයි මේ අත්ථි ප්‍රත්‍යය කියන එකෙන් කියන්නේ.

එක වෙලාවක නාම රූප රංචුවක් පහළ වෙනවා. ඒ නාම රූප ධර්ම ටික ඇති වෙච්ච ගමන් තවත් නාම රූප ධර්ම වලට උදව් කරනවා, උපකාර කරනවා. මෙන්න මේ වගේ ධර්මයක් තමයි මේකේ තිබෙන්නේ. ඉතින් මේ කථාව මේ විදියට කියනකොට යම්කිසි දෙයක් තිබෙන්න ඕනෑ උදව් කරන්න. ඒ තිබෙන දේ තිබෙන වෙලාවේදී උදව් කරනවා - තිබෙන වෙලාවේදී උදව් ලබනවා. උදව් කරන එක්කෙනාට **ප්‍රත්‍යය ධර්මය** කියනවා, උදව්ව ලබන්නාට **ප්‍රත්‍යය උප්පනය** කියලා කියනවා. මේක මෙන්න මේ විදියටයි පට්ඨාන විස්තරයේ තිබෙන්නේ.

**අත්ථිපච්චයොති – චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං අත්ථිපච්චයෙන පච්චයො. චත්තාරො මහාභූතා අඤ්ඤමඤ්ඤං අත්ථිපච්චයෙන පච්චයො. ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤං අත්ථිපච්චයෙන පච්චයො. චිත්තචෙතසිකා ධම්මා චිත්තසමුට්ඨානානං රූපානං අත්ථිපච්චයෙන පච්චයො. මහාභූතා උපාදාරූපානං අත්ථිපච්චයෙන පච්චයො.**

**අත්ථිපච්චයොති** = අත්ථිප්‍රත්‍යය කියන්නේ මොකක්ද? **චත්තාරො ඛන්ධා අරූපිනො** = ඒ කියන්නේ අරූපි වූ ස්කන්ධ 4 . ඒ තමයි **වේදනා ස්කන්ධය - සංඥා සක්න්ධය** - ඉතිරි චෛතසික ටික අයත් **සංස්කාර ස්කන්ධය** සහ **විඤ්ඤාණ ස්කන්ධය**. මේ තමයි එක පොකුරකට ආපු චිත්ත චෛතසික ටික හතරකට බෙදා ගත්ත විදිය.

ඊළඟට **අඤ්ඤමඤ්ඤං අත්ථිපච්චයෙන පච්චයො** = ඔවුනොවුන්ට අත්ථි ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා කියලා කියනවා.

ගිය වතාවේදී අපි මේ ගැන කථා කරන කොට ගත්තා **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස අත්ථිපච්චයෙන පච්චයො** කියලා. දැන් අපේ මේ පින්වත් පිරිස මේ වෙනකොට දැනගෙන තිබෙනවා කුසල ධර්ම කියලා කියන්නේ මොනවාද කියලා. ඔය සිත් 89 තිබුණාට චෛතසික 52 තිබුණාට රූප තිබුණාට ඔය ඔක්කොම කුසල කියලා ගන්නේ නෑ. නමුත් මේකත් අමතක කරන්න හොඳ නෑ, මම මේ අතිරේක ඇඳිල්ලක් කරන්නේ. මජ්ඣිම නිකායේ අරියපරියෙසන සූත්‍රයේ තිබෙනවා බුදුරජාණන් වහන්සේ එක අවස්ථාවක **කිං කුසලගවෙසීව** හසුරුනා කියලා. කිං කුසලගවෙසී කියලා කියන්නේ සසර දුකෙන් මිදීම පිණිස නිර්වාණ ධාතුව කුමක් දැයි කියලා හොයහොයා උන්වහන්සේ වැඩ ඉඳලා තිබෙනවා. එතකොට එතැනදී කිං කුසලගවෙසී කියන එකෙන් කියන්නේ නිර්වාණ ධාතුව කියන එකයි. එහෙම සාමාන්‍යයෙන් සම්මුති වශයෙන් කථා කරනකොට නිවනටත් කුසලය කියලා කියනවා. නමුත් මේ අභිධර්ම කථනයේදී ඔය ඔක්කොම කුසල් වෙන්නේ නෑ. සූත්‍රය ධර්මයේ කථා කරනවා නිර්වාණය ධාතුව කුසලයක් කියලා, කුසල ධර්මයක් හැටියට හොයනවා කියලා. අභිධර්ම කථනයට එනකොට නිර්වාණ ධර්මය හඳුන්වන්නේ අව්‍යාකෘතයක් කියලා. මෙතැන මේ චෛතසික 52 තිබුණාට සිත් 89 තිබුණාට මේ ඔක්කෝම කුසල් වෙන්නේ නෑ. මෙතැන තිබෙන්නේ කුසල සිත් වශයෙන් සිත් 21 විතරයි. කාමාවචර වශයෙන් 8ක් රූපාවචර වශයෙන් 5 ක් අරූපාවචර වශයෙන් 4 ක් සහ ලෝකෝත්තර මාර්ග 4. ඔය 21 ට තමයි කියන්නේ කුසල් සිත් කියලා. ඒ කුසල් සිත් එක්ක ගැවසෙන හැසිරෙන හැසිරෙන්න සුදුසු හැකියාව තිබෙන මිශ්‍ර වී කටයුතු කරන චෛතසික ධර්ම 38

තිබෙනවා. මේ චෛතසික ධර්ම 38 කුසල සිත් 21 තමයි මෙතැන **කුසලො ධම්මො** කියලා කියන්නේ. අපි හිතමු පිං සිතක් කුසල් සිතක් පහළ උනා කියලා. ඒ තමයි **කුසලො ධම්මො**. කවුරුහරි මලක් පහනක් පූජා කරන්න විහාරයකට ගියහම එයාට හරි ප්‍රසාදනීය කුසල් සිතක් පහළ වෙනවා. දැන් කුසල ධර්ම රංචුවක් **(කුසලො ධම්මො)** පහළ උනා. එතකොට එතැන කුසල සිතේ චෛතසික ටිකත් එක්ක ධර්ම පොකුරක් පහළ උනා. ඒ ධර්ම පොකුර පහළ උන ගමන්ම ඔවුනොවුන්ට උදව් කරනවා - **කුසලස්ස ධම්මස්ස** - ඒකයි **චත්තාරො අරූපිනො ඛන්ධා** කියලා කියන්නේ. ඒ චෛතසික පොදිය සහ සිත් අන්නෝන්‍ය වශයෙන් ඔවුනොවුන්ට උදව් කරගන්නවා = **අඤ්ඤමඤ්ඤං අත්ථිපච්චයෙන පච්චයො**. ඵස්සය වේදනාවට, වේදනාව සිතට, චේතනාව සිතට, මේ වගේ ඔවුනොවුන්ට උදව් කරගන්නවා. ඔවුනොවුන්ට ප්‍රත්‍යය වෙනවා. හරියට අර ලයිට් එක පත්තු වෙච්ච වෙලාවේම ෆොටෝ එක ගහ ගන්නවා වගේ. අන්න ඒ විදියට කුසල ධර්මයක් කුසල ධර්මයකට ප්‍රත්‍යය වෙනවා අත්ථි ප්‍රත්‍යයෙන්.

මේක තේරුම් කර ගන්න තවත් පොඩි කාරණයක් ඉරිදිපත් කළොත් මෙහෙම කියන්න පුළුවන්, **ඵස්සය** කියලා ධර්මක් තිබෙනවා. ඒක චෛතසිකයක්. එක්තරා හිතේ අනු ක්‍රියාකාරී ස්වභාවයක්. අපි කිව්වා ස්පර්ශයට දැනීමේ හැකියාව නෑ කියලා. ස්පර්ශයට තිබෙන්නේ සම්බන්ධ කිරීමේ, ස්පර්ශ කරවීමේ ගතිය පමණයි. දැනීමේ හැකියාව ස්පර්ශයේ නෑ. දැනීමේ හැකියාව තිබෙන්නේ හිතේ. විශේෂයෙන්ම ආරම්මණය ගැඹුරින්ම දැකීමේ හැකියාව තිබෙන්නේ ප්‍රඥාවේ. විඳීමේ හැකියාවත් ස්පර්ශයට නෑ. හිතක් මතු උනහම ඔය හිත මතු වෙච්ච වෙලාවේ ඕකත් එක්ක ඉදිරිපත්වෙන මතුවෙන ස්පර්ශය තමයි ඔය ටික ගිහිල්ලා ආරම්මණයේ තවරන්නේ, හප්පන්නේ. ඔය ස්පර්ශ කරපු වෙලාවේ තමයි ඒක දැනගන්නේ. එතකොට බලන්න ස්පර්ශය විඤ්ඤාණයට යමක් දැන ගන්න උදව් වෙනවා. ස්පර්ශය වේදනාවට යමක් විඳින්න උදව් කරනවා. හැබැයි ස්පර්ශය උදව් කරන්නේ ඒ පොකුර එකට ආපු වෙලාවට විතරයි. නැති වෙලාවට නෑ. කුසල සිතක් පහළ උනහම ඒ කුසල සිතේ පහළ වෙන ධර්ම රංචුව ඔය විදියට තමයි ඔවුනොවුන්ට උදව් වෙන්නේ. ඒක නිසා කියනවා **කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස අත්ථිපච්චයෙන පච්චයො** කියලා.

මේ කථාව අකුසල පැත්තට ගියහම අකුසලෙත් ඔය විදියයි. යම්කිසි කෙනෙකුට තරහක් ඇතිවෙනවා. ලෝභයක් ඇතිවෙනවා. ඒ අවස්ථාවේදී අකුසල ධර්මයෝ අකුසල ධර්මයන්ට ඔවුනොවුන් වශයෙන් උදව් වෙනවා උපකාර වෙනවා, තිබෙන කමින්, ඇති බැවින්, විද්‍යාමාන බැවින් උදව් කරනවා,

අනිත් එක තමයි අව්‍යාකෘත ධර්ම අව්‍යාකෘතයන්ට උදව් කරනවා උපකාර කරනවා. තව එකක් තිබෙනවා මේ විග්‍රහයේ, ඒ තමයි **චත්තාරො මහාභූතා අඤ්ඤමඤ්ඤං අත්ථිපච්චයෙන පච්චයො** = පඨවි - ආපෝ - තේජෝ - වායෝ යන සතර මහා භූතයෝ හතර දෙනා විද්‍යාමාන අවස්ථාවේදී තමයි ඔවුනොවුන්ට උදව් කරන්නේ, උපකාර කරන්නේ. එක පොඩ්ඩක් වත් ඉස්සර වෙලා හෝ පසු වෙලා ඒ ගොල්ලෝ උදව් වෙන්නේ නෑ. එතකොට මේ සතර මහා භූතයෝ එකිනෙකට උදව් කරන්නේ ඒවා **තිබෙන** වෙලාවේ. අනිත් අය උදව් ලබන්නේත් ඉන්න වෙලාවේ. ඒක නිසා ඒක **අත්ථි ප්‍රත්‍යයයි.**

ඊළඟට අපි කිව්වා උපදින අවස්ථාවේ චිත්ත චෛතසික ධර්මයෝ ඒවගේම රූප ධර්මයෝ නාම ධර්මයෝ ඔවුනොවුන්ට උදව් කරගන්නවා කියලා. ඒ කියන්නේ ඒ වෙලාවට උදව් කරන්න කෙනෙක් ඉන්නවා, ඒ තමයි නාම රූප ධර්මයෝ. උදව් ලබන්නත් කෙනෙක් ඉන්නවා, ඒ තමයි නාම රූප ධර්මයෝ.

ඊළඟට තවත් එකක් තිබෙනවා. ඒතමයි

**චිත්තචෙතසිකා ධම්මා චිත්තසමුට්ඨානානං රූපානං අත්ථිපච්චයෙන පච්චයො** = අපිට හිතක් පහළ වෙනකොට ඒ සිත්වල තිබෙනවා රූප උත්පාදනය කිරීමේ අමුතු ගැම්මක්. ඕක වැඩිපුර තිබෙන්නේ ජවන් සිත් වලයි. ඒ ජවන් සිත් වලින් උපදවන රූප වලට කියනවා **චිත්ත සමුට්ඨානික** රූප කියලා. ඒ චිත්ත සමුට්ඨානික රූප සිතක් නැතුව පහළ වෙන්නේ නෑ. සිතක් ඇවිල්ලා ඉන්න වෙලාවේ තමයි ඕවා

පහළ වෙන්නේ. ඒක නිසා තමයි කියන්නේ **චිත්තචෙතසිකා ධම්මා** (නාම ධර්මයෝ) **චිත්තසමුට්ඨානික** රූපයන්ට (ඒවායෙන් හට ගන්න රූප වලට) විද්‍යාමානත්වයෙන් උදව් වෙනවා, උපකාර වෙනවා, පිහිට වෙනවා. මෙන්න මේ වගේ ධර්මයක් තිබෙනවා.

තව ඉස්සරහට යනකොට රූපවල මෙහෙම කථාවක් කියනවා. මේ කාරණය බණ භාවනා ආදියට බොහෝ වැදගත් වෙනවා. ඒකනිසා මේකත් දැනගන්න එක හොඳයි.

**මහාභූතා උපාදාරූපානං අත්ථිපච්චයෙන පච්චයො** = මහා භූතයෝ 4 ක් තිබෙනවා. උපාදාය රූප 24 ක් තිබෙනවා. මහා භූත තිබෙන නිසා තමයි උපාදාය රූප ඇතිවෙන්නේ. චක්ඛු ප්‍රසාදය - සෝත ප්‍රසාදය - ඝාන ප්‍රසාදය - ජිව්හා ප්‍රසාදය - කායප්‍රසදය - වත්ථු රූප ස්වභාවය - ඉත්ථි රූප - පුරුස රූප - ඕජා රූපය - වර්ණ රූපය ආදී රූප උපාදා රූප. මේ උපාදා රූප තිබෙන්නේ මහා භූත ආශ්‍රය කරගෙනයි. දැන් අපි පස්ගොඩක් දිහා බැලුවහම අපිට පේන්නේ ආපොත් නොවෙයි තෙජෝත් නොවෙයි වායොත් නොවෙයි. අපිට එතැනදී හසුවෙන්නේ ඇස ගන්නේ උපාදාය රූපය පමණයි. ඒ තමයි වර්ණ රූපය.

අපි යමකට ඇහුම් කන් දෙනවා. දැන් මම මේ පින්වතුන්ට කථා කරනවා. මේ පින්වතුන්ට ඇහෙන්නේ පඨවිත් නොවෙයි ආපොත් නොවෙයි තෙජෝත් නොවෙයි වායොත් නොවෙයි. මේ පින්වතුන් අහන්නේ සද්දය පමණයි. ශබ්ද රූපය කියන්නේ උපාදාය රූපයක්. පඨවි ආපෝ තේජෝ වායෝ ආශ්‍රයෙන් පවතින අනිත් රූප වලට කියනවා උපාදාය රූප කියලා. ඇත්තටම මේ වචන හැදෙනේ වායෝ ප්‍රධාන කරගෙනයි. වායුව තමයි මේ ශබ්දය ළඟින්ම ඉන්න ස්වභාවය තිබෙන්නේ. දැන් මේ පින්වතුන් ග්‍රහණය කරගන්නේ උපාදාය රූපයක්. **මහාභූතා උපාදාරූපානං අත්ථිපච්චයෙන පච්චයො** - ඒකනිසා වායුව තිබෙන ටිකේදි තමයි ශබ්දයක් ඇතිවෙනවා නම් ඇතිවෙන්නේ.

අපි තවත් ඔය ගැන හිතුවොත් එහෙම අපි වේගයෙන් වාහනයක යනකොට ඔය වීදුරුවලින් එහෙම ශබ්ද ඇහෙනවා. හුළඟ තිබෙන කොට තමයි අපිට ඒ ශබ්දය තිබෙන්නේ. එතකොට සුළඟ යම්කිසි තැනක තිබෙනවා නම් මහා භූත රූප හැටියට උපාදාරූප එතැන තිබෙනවා.

ඊළඟට තිබෙනවා **චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො** = චක්ඛායතනය කියලා කියන්නේ උපාදාය රූපයක්. චක්ඛායතනය කියන්නා වූ මේ ප්‍රසාද රූපය චක්ඛුවිඤ්ඤාණ කියන නාම ධර්මයටත් (**චක්ඛුවිඤ්ඤාණධාතුයා**) සම්ප්‍රයුක්ත චෛතසික ධර්මයන්ටත් (**තංසම්පයුත්තකානඤ්ච ධම්මානං**) අත්ථි ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා (**අත්ථිපච්චයෙන පච්චයො**). චක්ඛායතනය හෙවත් ඇස විද්‍යාමාන ස්වභාවයෙන් තිබෙන වෙලාවේ තමයි නාම ධර්මයන්ට පිහිට වෙන්න උපකාරයක් කරන්න පුළුවන් කම තිබෙන්නේ. නැත්නම් බෑ.

ඔය විදියමයි සොතායතනය. **සොතායතනං සොතවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො.** = කන, ඒ රූප ටික තිබෙන වෙලාවේ සෝතවිඤ්ඤාණධාතුවට සහ ඒ චෛතසික ධර්මයන්ට උදව් වෙනවා උපකාර වෙනවා.

**ඝානායතනං ඝානවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො** = නාසය, ඒ රූප ටික තිබෙන වෙලාවේ ඝානවිඤ්ඤාණධාතුවට සහ ඒ චෛතසික ධර්මයන්ට උදව් වෙනවා උපකාර වෙනවා.

**ජිව්හායතනං ජිව්හාවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො** = දිව, ඒ රූප ටික තිබෙන වෙලාවේ ජිව්හාවිඤ්ඤාණධාතුවට සහ ඒ චෛතසික ධර්මයන්ට උදව් වෙනවා උපකාර වෙනවා.

**කායායතනං කායවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො** = කය, ඒ රූප ටික තිබෙන වෙලාවේ කායවිඤ්ඤාණධාතුවට සහ ඒ චෛතසික ධර්මයන්ට උදව් වෙනවා උපකාර වෙනවා.

චක්ඛු - සෝත - ඝාන - ජිව්හා - කාය කියන මේ ආයතන හයම ඒ ඒ වෙලාවට අදාළ විඤ්ඤාණධාතුවට සහ චෛතසික ධර්ම වලට (විශේෂයෙන් මෙතැන පහළ වෙන්නේ සර්ව චිත්ත සාධාරණ චෛතසික හත) අත්ථිප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. හරියට flash එක ගහපු ගමන්ම ෆොටෝ එක ගන්න වගේ ඒක එනකොටම අනිත් අය උදව් ලබනවා. මේක හරි අමුතුම ධර්මයක්.

මේ චිත්ත ධර්ම වල චෛතසික ධර්ම වල මේ වගේ එකතැනක එක ගුලියට එක පොදියට පහළ වෙලා එකට මිරිකිලා එක ගුලියට එක පොදියට එක ආරම්මණයක් අල්ලාගෙන එක ආරම්මණයකට යොමුවෙලා පහළ වෙලා එකා වගේ, ඒ උනාට වෙන වෙනම ධර්ම එතැන ඉඳගෙන ඔවුනොවුන්ට උදව් කරගන්නවා උපකාර වෙන ගතියක් ඕවා අස්සේ තිබෙනවා කියන කථාව ගැන හිතාගෙන යනකොට තමයි තේරෙන්නේ තථාගතයන් වහන්සේගේ සර්වඥයන්වහන්සේගේ බුදු නුවණේ තිබෙන සියුම් බව. උන්වහන්සේගේ මනසිකාර ශක්තියේ, ඒ නුවණේ තිබෙන පුංචි පුංචි තීක්ෂණ ස්වභාවය මෙහෙමයි කියලා තේරෙන්නේ එතකොටයි. මේ විදියට උන්වහන්සේට බලන්න පුළුවන්කම තිබුණා, එක තැනක ඉඳගෙන ඔවුනොවුන්ට කරන උදව්ව, උපකාරය, ඒක ප්‍රත්‍යය වෙන විදිය, ප්‍රත්‍යය ස්වභාවය.

දැන් මේ කියාගෙන ගියේ චක්ඛු - සෝත - ඝාන - ජිව්හා - කාය කියන ආයතනය ටික කොහොමද චක්ඛු සෝත ආදී විඤ්ඤාණධාතූන්ට සහ චෛතසිකයන්ට ඒ වෙලාවේ පිහිටලා උදව් වෙච්ච විදිය.

අනිත් අතට ඔය ආයතන ටිකට තව උදව්වක් හම්බවෙනවා. ඒ තමයි - **චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො** එතකොට බලන්න මෙතැන තිබෙන චක්ඛු ප්‍රසාදය චක්ඛු විඤ්ඤාණ ධාතුවට සහ චෛතසිකයන්ට උදව් වෙන්නේ පිහිටා සිටීමටයි, නිශ්‍රය වශයෙන්. 'අපිව ආධාර කරගෙන ඔබට ඕනෑම දෙයක් බලන්න' කියනවා වගේ. කන්දක් උඩට ගිහිල්ලා මනුස්සයෙක් ඈත තිබෙන මොකක් හරි දෙයක් බලනවා. එතකොට ඒ මනුස්සයාට කන්ද උපකාර වෙන්නේ ඉන්නයි. ක්ෂේත්‍රයටයි, පය ගහලා ඉන්නයි. ඒ මනුස්සයා එහෙම හිටියට බලන්නේ තමන් පය ගහලා ඉන්න භූමිය නොවෙයි. එයා බලන්නේ කන්ද උඩට ගිහිල්ලා ඈත එකක්. ආන්න ඒ වගේ මේ ආයතනයෝ චක්ඛු විඤ්ඤාණ ධාතුවට - සෝත විඤ්ඤාණ ධාතුවට - ඝාන විඤ්ඤාණ ධාතුවට - ජිව්හා විඤ්ඤාණ ධාතුවට - කාය විඤ්ඤාණ ධාතුවට සහ චෛතසිකන්ට නිශ්‍රය වශයෙන්, භූමියක් හැටියට ඒකේ නැගලා ඉන්න දෙයක් හැටියට උදව් වෙනවා අත්ථි ප්‍රත්‍යය භාවයෙන්.

**රූපායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො. සද්දායතනං සොතවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො. ගන්ධායතනං ඝානවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො. රසායතනං ජිව්හාවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො. ඵොට්ඨබ්බායතනං කායවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො. රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං මනොධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො.**

ඊළඟට ඒ විඤ්ඤාණ වලින් දැන ගන්න දෙයක් අවශ්‍යයයි. ඒ කියන්නේ චක්ඛු විඤ්ඤාණයට වර්ණ රූපය ඊළඟට සද්දය කියන එක, ගන්ධය, රසය, ස්පර්ශය යන මේවා තමයි විඤ්ඤාණ ධාතූන්ගෙන් දැනගන්න දේවල්. ඒ ටිකත් ඒ වෙලාවට තිබෙනවා = අත්ථි ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. මෙන්න මේ කියන්නා වූ මේ රූපයෝ විඤ්ඤාණ ධාතූන්ට සහ චෛතසිකයන්ට උදව් වෙනවා, උපකාර වෙනවා. මේකෙන් ගත්ත රූප - ශබ්ද - ගන්ධ - රස - ස්පර්ශ යන මේවා ඇතුලත මනෝ ධාතුවට එනම් සම්පටිච්ඡන - සන්තීරණ - වොත්ථපන යන මේවාට සහ චෛතසිකයන්ට අත්ථි ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. හැම එකක්ම උදව්කරන්න ඒ වෙලාවේ තිබෙන දෙයක් වෙන්න ඕනෑ.

මේ පහම කියලා පස්සේ මෙහෙම කියනවා -

**යං රූපං නිස්සාය මනොධාතු ච මනොවිඤ්ඤාණධාතු ච වත්තන්ති, තං රූපං මනොධාතුයා ච මනොවිඤ්ඤාණධාතුයා ච තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො.**

මනෝ ධාතුවයි මනෝ විඤ්ඤාණ ධාතුවයි වෙන area එකක්. චක්ඛු විඤ්ඤාණයට ඉන්න පුළුවන් ඇස උඩ. සෝත විඤ්ඤාණයට ඉන්න පුළුවන් කන ආශ්‍රය කරගෙන. ඝාන ජිව්හා කාය ආදී විඤ්ඤාණ ධාතුන්ට ඒ ඒ ඒවා ආධාර කරගන්න පුළුවන්. නමුත් මනෝධාතුවටත් මනොවිඤ්ඤාණධාතුවටත් ඉන්න බෑ චක්ඛු විඤ්ඤාණය ඉන්න තැන, ඒවගේම සෝත ප්‍රසාදය පැත්තට යන්න බෑ. ඒකනිසා මනෝධාතුවටත් මනොවිඤ්ඤාණධාතුවටත් වෙනම තිබෙනවා ඇතුලේ කාමරයක්. ඒ තමයි **වත්ථු රූපය.** ඒකට හෘදය වත්ථු රූපය කියලත් කියනවා. මේක ආධාර කරගෙන මනෝධාතුවත් මනොවිඤ්ඤාණධාතුවත් පවතිනවා. ඒකත් ඇති වෙච්ච වෙලාවේ තමයි ඒ දෙන්නට සහ චෛතසික ධර්මයන්ට උදව් වෙන්නේ උපකාර වෙන්නේ. ඒක නිසා මේ **අත්ථි ප්‍රත්‍යය** භාවය මේ විදියට පට්ඨාන මාතෘකා විස්තරයේ නිද්දේස වාරයේදී දේශනා කරලා තිබෙනවා.

අපි විස්තරයක් හැටියට ගත්තයින් පස්සේ කුසල වීථි වාරය, අකුසල වීථි වාරය, අව්‍යාකෘත වීථි වාරය ගැන චිත්ත වීථි 3 කින් අපි කිව්වා.

මේකේ මහා විසාල විස්තර ගොඩක් තිබෙනවා ඒකියන්නේ ආකාර හතකට මේක සම්බන්ධ කරලා කියලා දෙනවා. අපි ඉස්සරහදි අවස්ථාව ලැබෙන ලැබෙන විදියට අනිත් ඒවත් සම්බන්ධ කරලා ඉදිරිපත් කරමු.

ඊළඟට තිබෙනවා මේකේ විරුද්ධ අර්ථය. ඒ තමයි **නත්ථි ප්‍රත්‍යය.** නත්ථි ප්‍රත්‍යය කියන එක තේරුම් ගන්න ඕනෑ මෙහෙමයි. සිත්වල ස්වභාවය තමයි එක මනුස්සයෙකුගේ සන්තානයේ එක හිතක් ඇවිල්ලා තිබෙන වෙලාවේ, අපි හිතමු චක්ඛු විඤ්ඤාණය කියලා. ඔය චක්ඛු විඤ්ඤාණය ක්‍රියාත්මක වෙන වෙලාවේ කිසිසේත්ම සෝත විඤ්ඤාණයක් හෝ ඝාන විඤ්ඤාණයක් හෝ වෙන මොන විඤ්ඤාණයක්වත් පහළ වෙන්නේ නෑ. ඊළඟට හිත ඇතුලේ යම්කිසි කුසල ජවනයක් තිබෙන වෙලාවක ඒ කුසල ජවන් සිත තිබෙන වෙලාවේ වෙන කිසිම ජවනයක් පහළ වෙන්නේ නෑ.

කුසල් අකුසල් වශයෙන් ගත්තොත් එහෙම කුසල් සිතක් තිබෙන වෙලාවේ කිසිසේත්ම අකුසල සිතක් පහළ වෙන්නේ නෑ. ඒක නිසා ඉස්සරවෙලා පහළ වෙච්ච සිත එතැනින් හෙමිහිට බැහැලා යන්න ඕනෑ. එහෙම බැහැලා ගිහිල්ලා ඒක නැති උනාට පස්සේ තමයි ඊළඟ හිතක් එන්නේ. ආන්න ඒ වගේ ඒ ඇතිවෙලා තිබුණා වූ සිත ඒ තිබ්ච්ච හරියේ නැති උනාට පස්සේ ඒක නැති වෙලා ගියාට පස්සේ ඒ නැති වෙලා ගිය තැනට තමයි තව සිතක් පහළ වෙන්නේ. එතකොට බලන්න මේ අලුතින් එන හිතට අර ඉස්සෙල්ලා හිත පහළ වෙලා ගිහිල්ලා තිබෙන හිස් තැන, එතැන සිතක් නැති බව උදව් උනා. අන්න ඒ කථාව තමයි **නත්ථි ප්‍රත්‍යය** කියලා කියන්නේ. පස්සේ පහළ වෙන්නා වූ සිතකට හරි ලේසියෙන් එතැනට එන්න පුළුවන්, එතැන මොකක්වත් නෑ, ඉස්සෙල්ලා තිව්ච්ච සිත එතැනින් අයින් වෙලා ගිහිල්ලා. ඒ නැති බව තමයි **නත්ථි ප්‍රත්‍යය** කියලා කියන්නේ.

මේක අපි මීට ඉස්සෙල්ලත් කථා කළා. එක පුටුවක සමාන්‍යයෙන් පුටුවක වාඩිවෙන පිළිවෙලට වාඩි වෙන්න පුළුවන්කම තිබෙන්නේ එක මනුස්සයෙකුට පමණයි. ඒ මනුස්සයාගේ ඔඩොක්කුවේ තව කෙනෙකුට වාඩි වෙන්න පුළුවන්. එතකොට ඒ වාඩිවෙන්නේ පුටුවේ නොවෙයි, ඔඩොක්කුවේ. ඒක නොවෙයි මේ කියන්නේ. පුටුවේ වාඩි වෙන පිළිවෙලකට එක මනුස්සයෙකුට එක වෙලාවක වාඩිවෙන්න පුළුවන් කම තිබෙන්නේ එක්කෙනෙකුට පමණයි. එතකොට ඒ පුටුවෙන් ඒ මනුස්සයා නැගිටලා ගියාට පස්සේ තව එක්කෙනෙකුට වාඩි වෙන්න පුළුවන්. හේතුව, ඒ පුටුවේ කවුරුවත් නැති බව දෙවෙනි එක්කෙනාට වාඩිවෙන්න උදව් වෙනවා උපකාර වෙනවා ප්‍රත්‍යයක් වෙනවා. මෙන්න මේක තමයි **නත්ථි ප්‍රත්‍යය** කථාවෙන් කියලා දෙන්නේ.

ඒකටත් තිබෙනවා කුසල් වීථි. එතැන කියලා දෙනවා කුසල ධර්මයෝ ඇති වෙලා නැති උනාට පස්සේ කුසල ධර්ම පරම්පරාවේ තව එකකට පහළ වෙන්න ඒක උදව් වෙනවා, උපකාර වෙනවා.

ඔකේ තව එකක් තිබෙනවා. ඒ තමයි මේ **නත්ථි ප්‍රත්‍යයට** සමානයි 23 වෙනි ප්‍රත්‍යය හෙවත් **විගත ප්‍රත්‍යය.** විගත කියලා කියන්නේ අයින්වෙලා යනවා කියන එක. ඇත්තවශයෙන්ම ඉස්සර කාලේ

ස්වාමීන්වහන්සේලාත් ඒකෙ වැඩි වෙනසක් දක්වලා නෑ. බොහෝම පොඩිම පොඩි රේඛාවකින් ගහන්න පුළුවන් විදියකට තමයි ඒක තිබෙන්නේ. ඒ කියන්නේ උත්පාදයත් ඇවිල්ලා - ඨීතියත් ඇවිල්ලා - භංගයත් ඇවිල්ලා ඒ විද්‍යමාන ස්වභාව තුනම නැති ඉස්සෙල්ලා තිබ්බ්ච එක නැතිවෙලා ගියාට පස්සේ **නත්ථි භාවය** එනවා. නත්ථි භාවය වගේ තමයි විගත භාවය. ඉස්සෙල්ලා තිබ්බ්ච දේ නැතිවෙලා ගියා කියන කථාවයි මේ කියන්නේ. **නත්ථි ප්‍රත්‍යය** කියලා කියන්නේ **දැනට මුකුත් නෑ** කියන එකයි. **විගත ප්‍රත්‍යය** කියලා කියන්නේ **ඉස්සෙල්ලා තිබ්බ්ච එක ගියා** කියන එකයි. මෙන්න මේ ධර්මතා දෙකේ තිබෙන පොඩි වෙනස තමයි ඔය වචන දෙකෙන් කියන්නේ.

අනිත් එක තමයි **අත්ථි ප්‍රත්‍යය** සහ **අවිගත ප්‍රත්‍යය** කියන දෙකේත් සමාන ගතියක් තිබෙනවා. අත්ථි කියලා කියන්නේ දැනට තිබෙනවා, අවිගත කියලා කියන්නේ යන්න යන එක්කෙනා තවම ගිහිල්ලා නෑ කියන එක.

තවත් එකක් තමයි මේ ධර්මතා හතර තේරුම් ගන්නකොට මේ කාරණා කථා කරන්නේම සංස්කාර ධර්මයන් හෙවත් ඇති වීම නැති වීම් ස්වභාවයන්ට යටත් වෙන තැන් වල තිබෙන ධර්ම කොට්ඨාසවල විතරයි. නිර්වාණ ධාතුවට මේක සම්බන්ධ කරගන්නේ නෑ. අපි පාරමී ගුණ පුරාගෙන ගිහිල්ලා ගිහිල්ලා හිත දියුණු කරලා ඉන්ද්‍රිය ධර්ම වඩලා යම්කිසි දවසක නිවන් අවබෝධ කරගන්නවා. එතකොට නිවන් අවබෝධ කරගන්නේ නිවන තිබෙන නිසා. නැති දෙයක් අපිට අවබෝධ කරගන්න බෑ. එතකොට නිවන නැතිවෙලත් නෑ. එතකොට අවිගත ප්‍රත්‍යය වෙන්න පුළුවන්. නමුත් ඒ වගේ කථාවක් නිවනට දාන්නේ නෑ. නිවනට දාන්නේ නැත්තේ මේ විගත ගතිය අවිගත ගතිය නිර්වාණයේ පිහිටන්නේ නෑ, ඒකෙ ඇතිවීමක් නැති වීමක් නැති නිසා. අනිත් එක තමයි අත්ථි ගතිය නත්ථි ගතිය කථා කරන්නෙත් නෑ, විගත ගතිය අවිගත ගතිය කථා කරන්නෙත් නෑ. මේ අත්ථි ප්‍රත්‍යය ගතිය තිබෙන්නේ නත්ථි ප්‍රත්‍යය ගතිය තිබෙන්නේ විගත ප්‍රත්‍යය ගතිය තිබෙන්නේ අවිගත ප්‍රත්‍යය හෙවත් තවම බැහැර වෙලා නෑ කියන ගතිය තිබෙන්නේම හැම වෙලාවේම මේ කියන්නා වූ හේතු ප්‍රත්‍යය ධර්ම තිබෙන තැන පමණයි. චිත්ත චෛතසික රූප වලට පමණයි ඒක සම්බන්ධ කරන්නේ, ඇඳන්නේ.

ඔය විදියටම තමයි තිබෙන්නේ **අවිගත ප්‍රත්‍යය.** එය අත්ථි ප්‍රත්‍යයට සමානයි. පාලි වාක්‍යයත් ඒ විදියමයි.

**අවිගතපච්චයොති – චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං අවිගතපච්චයෙන පච්චයො. චත්තාරො මහාභූතා අඤ්ඤමඤ්ඤං අවිගතපච්චයෙන පච්චයො.**

උපදින අවස්ථාවේත් ඒ විදියමයි = **ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤං අවිගතපච්චයෙන පච්චයො.**

**චිත්තචෙතසිකා ධම්මා චිත්තසමුට්ඨානානං රූපානං අවිගතපච්චයෙන පච්චයො. මහාභූතා උපාදාරූපානං අවිගතපච්චයෙන පච්චයො.**

ඊළඟට චක්ඛායතන සොතායතන ඝානායතන ඒ විදියටමයි.

**චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයෙන පච්චයො. සොතායතනං සොතවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයෙන පච්චයො. ඝානායතනං ඝානවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයෙන පච්චයො. ජිව්හායතනං ජිව්හාවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයෙන පච්චයො. කායායතනං කායවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයෙන පච්චයො.**

**රූපායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයෙන පච්චයො. සද්දායතනං සොතවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයෙන පච්චයො. ගන්ධායතනං ඝානවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයෙන පච්චයො. රසායතනං ජිව්හාවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයෙන පච්චයො.**

**ඵොට්ඨබ්බායතනං කායවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයෙන පච්චයො. රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං මනොධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයෙන පච්චයො.**

**යං රූපං නිස්සාය මනොධාතු ච මනොවිඤ්ඤාණධාතු ච වත්තන්ති, තං රූපං මනොධාතුයා ච මනොවිඤ්ඤාණධාතුයා ච තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයෙන පච්චයො.**

අපේ පින්වතුන්ට මම අද අපි දිගට කථා කරගෙන ආපු, සමහර වෙලාවට ස්කන්ධ විස්තර කරලා සමහර වෙලාවට අපේ භාෂාවෙන් චිත්ත චෛතසික රූප ටික විතරක් එක්කාසු කරගෙන සමහර වෙලාවට වීථි වාර සංග්‍රහයේ උදව් උපකාර ලබාගෙන මේ පින්වතුන්ට මේ දක්වාම විශේෂ ධර්ම කථනයක් පට්ඨාන විස්තරය යටතේ කියාගෙන විස්තර කරගෙන ආවා. ඉතින් අද මේ ධර්මතා හතරම එකට අරගෙන මේ විදියට විස්තර කළේ ඒකෙ තිබෙන සමාන කමත් එක්ක.

තව එකක් තිබෙනවා මේකෙන් එහා පැත්තට ගියහම. මේ ප්‍රත්‍යය විස්තරය අද මේ විදියට අවසන් කරමු. නමුත් මේකේ මිශ්‍රණ කථාවක් වෙනම තිබෙනවා. මිශ්‍රණ කථාව කියලා කියන්නේ එක වෙලාවකට ප්‍රත්‍යය ධර්ම කීපයක් වැඩ කරනවා. එක තැනක මහා රංචුවක් වැඩ කරනවා. අපි කිව්වොත් මෙහෙම, දැන් කෑම වලට ඉඟුරු දානවා බොහෝ වෙලාවට. කෑම වලට ඉඟුරු දැම්මහම ඉඟුරු කෑමකුත් වෙනවා බෙහෙතකුත් වෙනවා. කෙනෙකුට ඒක නියෝජනය කරන්න පුළුවන් බෙහෙතක් කියලා. කෙනෙකුට ඒක නියෝජනය කරලා කථා කරන්න පුළුවන් ආහාරයක් කියලා. ඒකෙ ආහාරමය ගතියත් තිබෙනවා, ඖෂධීය ගතියකුත් තිබෙනවා.

අපි යම්කිසි විදියකින් මෙහෙම කථා කළොත්, එක මණ්ඩලයක සභාපති ලේකම් භාණ්ඩාගාරික ඇතුළු සමාජිකයෝ හැමෝම එකට වැඩ කරනකොට අපි හිතමු ඒ ගොල්ලෝ මොකක් හරි ක්‍රියාකාරී ස්වභාවයක් සිද්ධ කරනවා කියලා. යම්කිසි ආයතනයක වැඩක් කරනකොට ඒ ගොල්ලෝ සමිතියක හැටියට සමාජිකයෝ හැටියට නියෝජනය වෙලත් එතැන ඉන්නවා. මනුස්සයෝ හැටියට මනුෂ්‍යාත්වයෙන් ඉදිරිපත් වෙලත් ඉන්නවා. එතකොට මනුෂ්‍යය උපකාරයකුත් තිබෙනවා සමිති සාමාජීය උපකාරයකුත් තිබෙනවා. අපි හිතමු ඒ ගොල්ලෝ ගම් කීපයක අය කියලා. එතකොට ගම් කීපයක ගැමියෝ නම් ඒ ගම් කීපයම නියෝජනය කරන්නා වූ ගතියකුත් තිබෙනවා. එකතැනක එක වෙලාවෙයි මේක වෙන්නේ. ආන්න ඒ වගේ අපි කථා කරපු ප්‍රත්‍යය ශක්ති ගුණ තිබෙන ධර්මතා හැටියට මේ කාණ්ඩ 24 ක තැන් 24 ක මේ කථා කරපු ටික එක තැනක වැඩ කරන විදිය වෙනම විස්තරයක් කරනවා. ආන්න ඒකත් අපි ඉස්සරහදි දැන ගනිමු. සමහර වෙලාවට පටිච්චසමුප්පාදයටත් සම්බන්ධ කරලා ඊළඟට අපේ ඇස කන නාසය දිව ශරීරයෙන් අපි මේ ලෝකයට සම්බන්ධ වෙනකොට ඒවත් එක්ක කීයක් මොන විදියට පහළ වෙනවද කියලා ඒවත් අපිට දැනගන්න පුළුවන්.

ඇත්තටම මේවා සත්වයෝ නොවෙයි. මේවා සත්ව ගති වලින් හිස්. මේවා පුද්ගලයොත් නොවෙයි. පුද්ගල ගති වලින් හිස්. ආත්ම ගතිත් නෑ. ඉතින් මේ වේගයෙන් දිව යන්නා වූ ක්‍රියා වලියකට නොදන්නා කම නිසා අපි එක එක නම් දාල, පුද්ගල සංඥා දාලා ඒ විදියට බාර අරගෙන දිව්‍ය සංඥා මනුස්ස සංඥාවල් වද්දවලා ඒවා ඒ විදියට බාර අරගෙන නොදන්නා කමින් මෝහයෙන් මුලාවෙන් අපි දාපු මේ සත්ව සංඥාවල් අපිටම ගලවගන්න බැරුව ඉන්නේ. ඉතින් මේ ටික කොහොම හරි ගලවගන්න මේ විදියට තිබෙන විස්තර කථනය හරි පිහිටක් හරි උදව්වක් හරි උපකාරයක් වෙනවා. ඒක නිසා අපේ පින්වතුන් හැම දෙනාටම අපි මෛත්‍රීයෙන් ආශ්ර්වාද කරනවා තව තව ගාම්භීර වූ ධර්ම කථනයට ඉස්සරහදි එක්කාසු වෙලා අපි අහපු නැති දේවල් ටික තේරුම් ගන්න දැනට අහලා තිබෙන ටිකේ උපකාරය අපිට ලබා ගන්න අධිෂ්ඨාන කරගනිමු. මේක මහා විසාල බොහෝම සූක්ෂම වෙච්ච ධර්ම කථනයක් සහ ධර්ම විස්තරයක්. මේක දෙවියන්ට දේශනා කළා කියන්නේ දෙවියන්ට දිවැස තිබෙන නිසා දෙවියන්ගේ දිවැසින් සියුම් වූ ධර්ම වලට සිතෙන් ස්පර්ශ වෙලා ඇතිලෙන්න පුළුවන් ගතියක් තිබෙනවා.

ඕලාරික රූප ආශ්‍රයේ ඕලාරික පරිසරයක ගං වතුරද ගිනි කඳුද ගින්දරද තිබෙන මහා විසාල පොළොවක් මතු පිටට වෙලා ඒ වස්තුවේ කොටස් කාරයෝ බවට පත්වෙලා ඉන්න අපිට හරි අමාරුයි පොඩ්ඩක්වත් උඩින් යාගන්න පුළුවන් කමක් නෑ. ශරිරත් ඕලාරිකයි. ඒක නිසා එවැනි තත්වයක වැඩි පුර මනස හසුරුවපු අයට දෙවියන්ට දේශනා කරපු තරම් සියුම් වූ දේවල් ග්‍රහණය කරගන්න බෑ. ඒ උනත් අපේ මනසිකාරය අවධි කළොත් දෙවියන්ට දේශනා කළා කියලා නොවෙයි අපිට මෙතැනිනුත් මේ නාම ධර්ම වල තිබෙන කොටස ග්‍රහණය කරගන්න පුළුවන්. එහෙම පුළුවන් කමක් අපිට තිබෙන නිසයි ඔක්කෝටම නැති උනත් කොටසකට හරි බුදුරජාණන් වහන්සේ සැරියුත් හාමුදුරුවන්ට මේක මාතෘකා අනුසාරයෙන් දේශනා කරලා තිබෙන්නේ. සැරියුත් ස්වාමීන්වහන්සේ විස්තර කථනය, ඒ කොට්ඨාසය අපිට තමයි තිබෙන්නේ.

ඉතින් ඇත්ත වශයෙන්ම දැන් සමහර රටකට දවල් සමහර රටකට රාත්‍රී සමහර රටකට උදේ. අපේ රටේ රාත්‍රිය මැදියම් වේගන එනවා. ඉතින් මේ කාල වශයෙන් වෙනස් වෙච්ච පරිසරයක ඉඳගෙන අපි සියලුදෙනාම හිත් වශයෙන් මේ අභිධර්ම කථනයට එක්කාසු වෙලා ඇඳිලා මේ දක්වාම ඉතාමත් විසිතුරු ධර්ම කණ්ඩයක් තමයි අපි මේ සාකච්ඡා කරගෙන ආවේ. ඉතින් අපේ පින්වතුන්ට තවත් ප්‍රශ්න එහෙම තිබෙනවා නම් ඒවා අහලා ඉදිරිපත් කරලා ඒවටත් උත්තරයක් සොයා ගන්න අපි මහන්සි ගනිමු. ඉතින් මම බොහෝම මෛත්‍රීයෙන් කරුණාවෙන් ප්‍රාර්ථනා කරනවා ආශිර්වාද කරනවා අපේ පින්වත් සැම දෙනාටම උතුම් ධර්ම භාග්‍යයක් උදා උනා. ඒ වගේම මේ ධර්ම මනසිකාරය මේ මෙනෙහි කිරීමේ ප්‍රතිපදාව දිගටම කරගෙන යන්න ලැබේවා! මේ කාලය තුල අපිට රාග ද්වේශ මෝහ මාන උද්දච්ච ආදී කිසිම ක්ලේශයක් වැඩ කරන්නේ නැතුව හිත හසුරුවාගන්න පුළුවන් උනා. සමාධිගත සිතින් අපිට අහන්න අවස්ථාව ලැබුණා. මේ ප්‍රතිපදාවේ මේ විදියට දිගටම ගමන් කිරීමේ කෙළවර සැම දෙනාටම උතුම් අමා මහා නිර්වාණ ධාතුව අවබෝධ කරගන්න ලැබේවා කියලා මම පින්දෙමින් ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම තෙරුන්වන් සරණයි!

සාධූ! සාධූ! සාධූ!

<u>ජයන්ත මහත්මයා</u> - හොඳයි ස්වාමීන්වහන්ස අනන්ත අප්‍රමාණ පිං. ඔබ වහන්සේගේ කාල වෙලාවත් සළකලා අද දවසේ සාකච්ඡාව නිමා කරන්න පුළුවන් ස්වාමීන් වහන්ස. අපි ලබන සතියේත් සුපුරුදු වෙලාවට එකතු වෙන්න බලාපොරොත්තුවෙන් ඔබ වහන්සේට ඉතාම ගෞරවයෙන් යොමු වෙනවා නැවත වාරයක් අද දවසේ සාකච්ඡාව නිමා කරන ලෙසට. තෙරුවන් සරණයි!

<u>ස්වාමීන්වහන්සේ</u> - හැම දෙනාටම තෙරුවන් සරණයි! මේ පින්වතුන් ගොඩක් මේකට කැප වෙලා කටයුතු කළා. අත්ථි ප්‍රත්‍යය නත්ථි ප්‍රත්‍යය විගත අවිගත කියන ධර්ම ගැනයි අද කථා කළේ. අපි ඉස්සරහදි නත්ථි ප්‍රත්‍යය ආශ්‍රයෙන් අනන්තර ප්‍රත්‍යය ගැනත් කථා කරමු. එතකොට මේ පින්වතුන්ට අත්ථි ප්‍රත්‍යය නත්ථි ප්‍රත්‍යය දෙක තේරුම් ගන්නත් පුළුවන් වෙයි. මේ පින්වතුන්ගෙන් ප්‍රශ්නයක් එන එකත් අපි හරියට අගේ කරනවා. ප්‍රශ්නයක් අහනවා කියලා කියන්නේ මේ ගැන හෝඩුවාවක් හොයලා තියෙනවා කියන එක ඉදිරිපත් වෙනවා. සමහර කෙනෙකුට මේක ගාම්භීර වෙන්න පුළුවන් ඒක තමයි ඒකෙ හැටි. ඒ උනත් කොහේවත් කථා කරන්නේ නැති ධර්ම කාණ්ඩයක් අපි මේ විදියට කථා කරගෙන ආවේ. මම හරි කැමතියි මේ පින්වතුන්ට මේ කරුණු ටික කියලා දෙන්න. අපිටත් ගොඩක් පිං සිද්ධ වෙනවා තථාගතයන් වහන්සේගේ ධර්මය ගැඹුරු තැන් වලින්ම අල්ලාගෙන ඒ පැත්තෙන්ම යනකොට අපිට ගාම්භීර වූ සූක්ෂ්ම වූ නිර්වාණ ධාතුව අවබෝධ කරගන්න උපකාරයක් වෙනවා. ඒක නිසා අපේ පින්වත් ජයන්ත මහත්මයා මේ පින්වතුන් එක්කාසු කරගෙන අපිට දැනුම් දීලා මේ විදියට ධර්ම සමයක් උදාපත් කරගත්තා. ලෝකයේ මේ වෙලාවට ඉදිරිපත් වෙලා ඉන්නා වූ පින්වතුන්ටත් මීට පසුව මේවා අහන පින්වතුන්ටත් සැම දෙනාටමත් මේවා ප්‍රයෝජනවත් වෙනවා.

තවත් මේ ගැන කියනවානම් අපි කථා කරන වෙලාවේ මේ පින්වතුන් මෙය අහනවා, අහන්න ලැබෙනවා. ඒක අත්ථි ප්‍රත්‍යය වගෙයි. ඊළඟට පස්සේ මේ පින්වතුන් කවුරුහරි අහනවානම් ඒක පුරේජාත ප්‍රත්‍යය කියලා කියන්න පුළුවන්, ඉස්සෙල්ලා කියපු බණ පස්සේ අහන්න ලැබෙන නිසා.

එහෙම ගන්නත් පුළුවන්. ඒකත් ඒ විදියට හිතා ගන්න. සැම දෙනාටම ධර්ම අවබෝධය නිර්වාණ අවබෝධය වේවා!

අපේ පින්වත් ලලිත් දළුවත්ත මහත්මයා මේ ධර්ම මණ්ඩපය ආරම්භ කරලා ගොඩක් දුරට කටයුතු කරගෙන ආවා. ඉතින් ඒ පින්වත් මහත්මයාටත් නිදුක් නිරෝගී දීර්ඝායුෂ වේවා! ධර්මඥානය පහළ වේවා! භාවනා ඥානය පහළ වේවා! අපේ පින්වත් ජයන්ත මහත්මයාට ඊළඟට ප්‍රශ්න ඇසූ පින්වත් සැම දෙනාටම දුකක් කරදරයක් නැතුව හිත නිරෝගිව තබාගෙන ඉතාමත්ම හොඳින් මේ කියපු කාරණා තව තව මෙනෙහි කරමින් ඉස්සරහට ධර්ම චින්තනය හදාගෙන යන්න ලැබේවා! ඒවගේම මේ ධර්මය හොඳට මෙනෙහි කරලා සූත්‍ර අනුසාරයෙන් ගාම්භීර අභිධර්ම විස්තර අනුසාරයෙන් මෙනෙහි කරගෙන මේ ධර්ම වල මොන ප්‍රත්‍යය ශක්තිය තිබුණත් මොන ප්‍රත්‍යය ධර්මයක් උනත් මේවායේ සත්ව ගතියක් නෑ කියලා ඒ බව තේරුම් අරගෙන මේ ඔක්කොම චිත්ත ධර්ම අහකට දාලා ඔක්කොම චෛතසික ධර්ම අතහැරලා දාලා ඔක්කොම රූප ධර්ම අතහැරලා දාලා කර්මජ රූප, චිත්තජ රූප, අහාරජ රූප, ඍතුජ රූප ඔක්කොම අයින් කරලා දාලා ඒවා ආශ්‍රයේ ගැවසුනා වූ නාම ධර්මත් අයින්කරලා දාලා කිසිම දවසක ආපහු චිත්තයකට චෛතසිකයකට රූපයකට නොඑන ආපහු ඒවාට වදින්නේ නැති නිර්වාණ ධාතුව අවබෝධ වේවා කියලා මම සැම දෙනාටම මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධූ! සාධූ! සාධූ!



ඉහත සඳහන් ධර්ම දේශනාව
අති පූජ්‍ය භන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.